# විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව
# University Trade Union joint Committee


සම සභාපතිවරු

පී.එච්.ඩී.එස්. ප්‍රියන්ත
වෛද්‍ය පීඨය
රුහුණු විශ්වවිද්‍යාලය
071-4450507

එම්.ඩී. දබරේරා
වෛද්‍ය පීඨය
කැළණිය විශ්වවිද්‍යාලය
071-4464650

සම ලේකම්

ජනක විමලසූරිය
ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාලය
071-6811263

පී.කේ. රුවන් කුමාර
පේරාදෙණිය
විශ්වවිද්‍යාලය
071-4446753

භාණ්ඩාගාරික

ප්‍රියන්ත වීරසූරිය
පේරාදෙණිය
විශ්වවිද්‍යාලය
076-1735559

Joint Presidents

P.H.D.S. Priyantha
Faculty of Medical Science
University of Ruhuna
071-4450507

M.D. Dabarera
Faculty of Medical Science
University of Kelaniya
071-4464650

Joint Secretary

Janaka Wimalasuriya
University of Sri
Jayewardenepura
071-6811263

P.K. Ruwan Kumara
University of
Peradeniya
071-4446753

Treasure

Priyantha
Weerasuriya
University of
Peradeniya
077-9024612


2020-08-27

ගරු ප්‍රවාහන අමාත්‍ය
ගාමිණී ලොකුගේ මැතිතුමා
සභාපති
විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල වැටුප් හා විෂමතා ගැටලුව විසඳීම සඳහා
කමිටු නිර්දේශ
7 වන මහල
සෙත්සිරිපාය
බත්තරමුල්ල

**විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල වැටුප් හා විෂමතා ගැටලුව විසඳීම සඳහා කමිටු නිර්දේශ ලබා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රජාවට බලපා ඇති වැටුප් විෂමතාවය නිවැරදි කර ගැනීමට ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත් කරන ලද ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුව මෙතෙක් ගනු ලැබූ අවංක උත්සාහයට අප විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුවේ ස්තූතිය පුද කරමු.

උක්ත කරුණ සම්බන්ධව උක්ත කමිටුවේ ලේකම් ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා අමතන ලද 2020-07-09 දාතම ලිපිය (ඇමුණුම 01) වශයෙන් මෙයට යා කර ඇත.

ඉහත ලිපියට පිළිතුරු ලෙස ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා විසින් මාගේ අංක UGC/HR/2/9/86 (17th VOL) හා 2020-07-23 දාතමයෙන් එවන ලද ලිපිය ද (ඇමුණුම 02) මෙයට යා කර ඇත.

උක්ත කමිටුවේ ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්තුමා වන ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා අප වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව වෙත එවන ලද ලිපියෙහි අවසාන ඡේදයේ "කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2020-06-16 දින ජාතික වැටුප් කොමිෂන් සභාව සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත් වූ බවත්, 2020-07-16 වන දින තවත් සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බවත්, ඉහත සාකච්ඡාවෙන් පසුව ජාතික වැටුප් කොමිෂන් සභාව විසින් ලබා දෙන නිර්දේශ ද සැළකිල්ලට ගෙන විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයෙහි වැටුප් විෂමතා ගැටලුව විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ඉදිරිපත් කර ඇති යෝජනාවලිය සම්බන්ධයෙන් කඩිනම් පිළිතුරක් යොමු කිරීමට කටයුතු කරන බව මා වෙත ද පිටපතක් සහිතව අග්‍රාමාත්‍ය ලේකම් වෙත 2020-07-14 දිනැති ලිපිය මගින් දන්වා ඇති බව දන්වා ඇත".

මේ වන විට එම සාකච්ඡාව ශුභවාදීව අවසන්වී ඇතැයි අපේක්ෂා කරන අතර, විශ්වවිද්‍යාල ප්‍රජාවට 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා බලපැවැත්වෙන වැටුප් විෂමතාවය නිවැරදි කිරීමට අවශ්‍ය නිර්දේශ ඔබතුමා වෙත ලබා දී ඇතැයි විශ්වාසය පළ කරමු.

ඒ අනුව ඔබතුමාගේ සභාපතිත්වයෙන් පත් කර ඇති කමිටුව මගින් හැකි ඉක්මණින් විශ්වවිද්‍යාල ප්‍රජාවට බලපා ඇති වැටුප් විෂමතාවයට කඩිනම් විසඳුම් ලබා දෙනු ඇතැයි විශ්වවිද්‍යාල ප්‍රජාව දැඩි විශ්වාසයෙන් බලා සිටින බැවින් එහි වර්තමාන තත්වය සම්බන්ධව අපව දැනුවත් කරන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු.

විශ්වවිද්‍යාලයීය වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුවේ නියමය පරිදි,

(පී.එච්.ඩී.එස්. ප්‍රියන්ත/එම්.ඩී. දාබරේරා)
සම සභාපතිවරු

(ජනක විමලසූරිය/ පී.කේ. රුවන් කුමාර)
සමලේකම්වරු

පිටපත් ඃ

1. අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා, අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07
2. සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය, ලසන්ත අලගියවන්න මැතිතුමා,
3. අග්‍රාමාත්‍ය ලේකම්තුමා, අග්‍රාමාත්‍ය කාර්යාලය
4. ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශය අංක 18 වෝඩ් පෙදෙස කොළඹ 07
5. සභාපතිතුමා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. ලේකම්තුමා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව